**විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 01 දරන විධානය**

## සංචරණ අරමුණු සඳහා විදේශ විනිමය නිදහස් කිරීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් වන 2017 අංක 01 දරන 2017.11.20 දිනැති විධානයේ II වන උපලේඛනයෙහි 3.1.1 පරිච්ඡේදය මෙයින් අවලංගු කරන අතර, 2020.03.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම පරිච්ඡේදය වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ වන බව සියළුම බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

3.1.1. සංචාරක, ව්‍යාපාරික, පුහුණු, විදෙස් වෛද්‍ය ප්‍රතිකාර ආදී ඕනෑම අරමුණක් සඳහා විදෙස් ගත වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට අදාළ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන අවස්ථාවකදී ගමන් බලපත්‍රය මත සිදු කරනු ලබන උචිත සටහන් යෙදීමක් සමග බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් ඇ.එ.ජ. ඩොලර් 5,000 ක (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණයක) උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් මුදාහළ හැකිය.

(අත්සන් කළේ) **ආර්.ආර්. ජයරත්න**

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 මාර්තු 19